# පුවත් සරණිය
## සංස්කෘතික කේන්ද්‍රය

පළමුවන වෙළුම

ISSN

රුහුණ විශ්වවිද්‍යාලය, මාතර, ශ්‍රී ලංකාව





මාධ්‍ය පෙරහුරු වැඩසටහන



“රාමුව” සහ “සෙවනැලි” නාට්‍යයන් ප්‍රදර්ශනය



ප්‍රතිභා අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන තරඟාවලිය



කලාව සහ ජීවිතය

සංස්කාරක මණ්ඩලය
එම්.ආර්.එෆ්. රිෆ්කා
එන්.එච්.ටී. අනුරුද්ධ



## අන්තර්ගතය


සම්බන්ධීකාරකතුමාගේ ප්‍රකාශය

සංස්කෘතික කේන්ද්‍රය - හැඳින්වීම

සංස්කෘතික කේන්ද්‍රයේ නිළධාරී මණ්ඩලය

සංස්කෘතික කේන්ද්‍රයේ පාඨමාලා

වැඩසටහන් හා ක්‍රියාකාරකම්

සංස්කෘතික කේන්ද්‍රයේ ජයග්‍රහණ




## සම්බන්ධීකාරකතුමාගේ ප්‍රකාශය



රුහුණ විශ්වවිද්‍යාලයේ සංස්කෘතික කේන්ද්‍රය ආරම්භ වන්නේ 1999 නොවැම්බර් 21 දිනය. ඒ ප්‍රකට කලාකරුවෙකු වූ අභාවප්‍රාප්ත ආචාර්ය ධර්මසේන පතිරාජා මහතාගේ සුරතින් ය.

හරවත් සංවර්ධනයක් සඳහා ඒ හා සමගාමීව සංස්කෘතික සංරක්ෂණය, ප්‍රවර්ධනය හා ව්‍යාප්තිය සඳහා දිවයින පුරා සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීමට සමගාමීව එවකට රජය විසින් රට පුරා සංස්කෘතික මධ්‍යස්ථාන සංස්ථාපනය කිරීමට ගත් ප්‍රයත්නයට සමගාමීව විශ්වවිද්‍යාලයන්හිද සංස්කෘතික කේන්ද්‍ර පිහිටුවන ලදී.

එසේ සංස්ථාපනය වූ රුහුණ විශ්ව විද්‍යාලයේ සංස්කෘතිය කේන්ද්‍රය ආ ගමන් මඟ දශක තුනකට ආසන්න වෙමින් ඇත. එම ගමන් මගේ රුහුණු විශ්ව විද්‍යාලයේ විද්‍යාර්ථයින්ගේ සෞන්දර්යාත්මක රස වින්දනය ප්‍රවර්ධනය කර ගැනීමට මෙන්ම ඔවුන්ගේ සැඟවුණු සෞන්දර්යාත්මක විභවතා එළිපෙහෙළි කර ගැනීමට පියස්සක් වූ බව අප කේන්ද්‍රය හා බැඳුණු ස්මෘතීන් ආවර්ජනය කෙරෙනු ඇත.

සංස්කෘතික කේන්ද්‍රයේ එම අත්දැකීම් මතක ලෙස තැන්පත් කිරීමට කිරීමට සහාය වූ බොහෝ දෙනෙකුගේ මැදිහත්වීම අප විසින් අගය කළ යුතුය. පළමු සම්බන්ධීකාරක වූ විශ්‍රාමික මහාචාර්ය ජයන්ත අමරසිංහ මහතා ඇතුළු සියලු සම්බන්ධීකාරකවරුන්ගේ භූමිකාව මෙහිදී විශේෂයෙන් සිහිපත් කළ යුතුය . එමෙන්ම සංස්කෘතික කේන්ද්‍රයේ පීඨ නියෝජිතයින් මෙන්ම උපදේශක මණ්ඩලයේ සාමාජිකයින්ද සිහිපත් කළ යුතුය.

අප විසින් එහි ඉතිහාසයේ ප්‍රථම වතාවට වාර්ෂිකව ලිපි සරණියක් (News Letter ) ප්‍රකාශයට පත් කිරීමට උත්සුක වන්නේ සංස්කෘතික කේන්ද්‍රයේ කටයුතු විශ්වවිද්‍යාල ප්‍රජාවට අනාවරණය කිරීමටත්, විද්‍යාර්ථීයන්ගේ නිර්මාණශීලී ක්‍රියාකාරකම් සහ සංස්කෘතික කේන්ද්‍රයේ ව්‍යාපෘති සමාජගත කිරීමටත් හැකියාවක් ලැබේ යැයි අප අපේක්ෂාකෙරේ .
මෙම ලිපි සරණිය සංස්කරණය සඳහා දායකත්වය දැක්වූ තරංග අනුරුද්ධ මහතාට සහ රිෆ්කා රියාස් මෙනවියට අපගේ ස්තුතිය මෙයින් පිරිනමමු.

ආචාර්ය සුරංජිත් ගුණසේකර,
සංස්කෘතික කේන්ද්‍රය,
රුහුණ විශ්වවිද්‍යාලය,
මාතර.




සංස්කෘතික කේන්ද්‍රය, රුහුණ විශ්වවිද්‍යාල ප්‍රජාව අතර සෞන්දර්යාත්මක රසවින්දනය සහ විවිධ කලා කුසලතා ඔප්නැංවීම සඳහා ක්‍රියාත්මක මූලික නිල ආයතනයයි. මෙම ආයතනය බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා ඒකාබද්ධ වේ. එය 1999 නොවැම්බර් 21 වන දින ආරම්භ කොට ඇති අතර දැනට වසර 26 ක කාලයක් තුළ විවිධ සංස්කෘතික හා පර්යේෂණ අංශයන්හි කටයුතු සිදු කරයි. විශ්වවිද්‍යාලයීය සංස්කෘතික මධ්‍යස්ථානය, සංස්කෘතික දැනුවත්භාවය වර්ධනය කිරීම, ජාතික උරුමයන් ආරක්ෂා කිරීම සහ සිසුන් සහ පුළුල් විශ්වවිද්‍යාල ප්‍රජාව අතර සමාජ සමගිය ප්‍රවර්ධනය කිරීම සඳහා කැප වූ ආයතනයකි. එසේම, මෙම මධ්‍යස්ථානය සිසුන්, පීඨය සහ පුළුල් ප්‍රජාව අතර සංස්කෘතික ක්‍රියාකාරකම්, උරුමය සහ කලාත්මක ප්‍රකාශනය ප්‍රවර්ධනය කිරීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව, සංස්කෘතික කේන්ද්‍රය මගින් සංස්කෘතිකමය වශයෙන් විශාල කාර්යභාර්යයක් විශ්වවිද්‍යාලය කෙරෙහි ඉටු කෙරේ.

සංස්කෘතික හා කලාත්මක ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා සංස්කෘතික උත්සව, ප්‍රදර්ශන සහ රංගනයන් සංවිධානය කිරීම මෙන්ම සාම්ප්‍රදායික හා සමකාලීන ශ්‍රී ලාංකික සංස්කෘතික ප්‍රකාශන සඳහා සහය වීම, සංස්කෘතික වැඩසටහන් හා තරඟාවලි සඳහා සිසුන්ගේ සහභාගීත්වය දිරිමත් කිරීම, කලාව හා සංස්කෘතිය පිළිබඳ ශිෂ්‍ය සංවර්ධනයට පහසුකම් සැලසීම යනාදී සේවාවන් සංස්කෘතික කේන්ද්‍රය මගින් සිදු කෙරේ.

# සංස්කෘතික කේන්ද්‍රයේ අරමුණු

- සමස්ත රුහුණ විද්‍යාල ප්‍රජාවෙහි රසඥතාව සහ නිර්මාණ කෞශල්‍යය ප්‍රවර්ධනය කිරීම.
- ජාතික වැදගත්කමකින් යුත් රුහුණු ප්‍රදේශයට විශේෂිත වූ සංස්කෘතිකාංග පිළිබඳ පර්යේෂණ කිරීම, සංරක්ෂණය සහ ප්‍රවර්ධනය කිරීම.

# සංස්කෘතික කේන්ද්‍රයේ කාර්යයන්

අපේක්ෂිත අරමුණ සාක්ෂාත් කරගනු වස් සංස්කෘතික කේන්ද්‍රය ඒකක දෙකකින් සමන්විත වනු ඇත. ඒ අනුව, **සෞන්දර්ය ඒකකය හා පර්යේෂණ ඒකකය** එහි ක්‍රියාත්මක වේ. **සෞන්දර්ය ඒකකකය** යටතේ,

- චිත්‍රපට සහ වීඩියෝ දර්ශන ප්‍රදර්ශනය කිරීම.
- පුහුණු පාඨමාලා සහ ප්‍රාසාංගික දර්ශන සංවිධානය කිරීම.
- ජන කලා සංදර්ශන පැවැත්වීම.
- සංගීත පුහුණු පාඨමාලා සහ ප්‍රසංග පැවැත්වීම.
- නර්තන පුහුණු පාඨමාලා සහ ප්‍රසංග පැවැත්වීම.
- චිත්‍ර හා මූර්ති පුහුණු පාඨමාලා සහ ප්‍රදර්ශන පැවැත්වීම.
- සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම.

යනාදී වැඩසටහන් සංවිධානය කරනු ලබන අතර මෙම වැඩසටහන් යටතේ, සතිපතා චිත්‍රපටයක් ප්‍රදර්ශනය කිරීම මෙන්ම චිත්‍රපට පිළිබඳ සාකච්ඡා සම්මන්ත්‍රණ හා වැඩමුළු සංවිධානය කිරීම, නූතන සාම්ප්‍රදායික සහ පෙර අපර දෙදිග වේදිකා නාට්‍ය දර්ශන ඉදිරිපත් කිරීම, වාර්ෂිකව නාට්‍ය උළෙලක් සංවිධානය කිරීම සහ නාට්‍ය උළෙල අවසානයේ විචාරාත්මක සම්මන්ත්‍රණ සංවිධානය කිරීම, වාර්ෂිකව පාරම්පරික ජන කලා සංදර්ශනයක් සංවිධානය කිරීම, ගායන හා වාදන කුසලතාවයන් වර්ධනය කර ගැනීම සඳහා උනන්දු වන විශ්වවිද්‍යාල ප්‍රජාවට අයත් ඕනෑම පුද්ගලයෙකුට සහභාගී විය හැකි පෙර අපර දෙදිග සංගීත පුහුණු පාඨමාලා පැවැත්වීම හා සංගීත පුහුණු පාඨමාලාව අවසානයේ සහභාගිකයන්ගේ නිර්මාණ ඇතුළත් සංගීත උළෙලක් වාර්ෂිකව පැවැත්වීම, විවිධ ශෛලීන්වලට සහ සම්ප්‍රදායන්වලට අයත් නර්තන පුහුණු පාඨමාලා පැවැත්වීම සහ නර්තන පුහුණු පාඨමාලාව අවසානයේ සහභාගිකයන්ගේ නර්තන ප්‍රසංගයක් සංවිධානය කිරීම, චිත්‍ර හා මූර්ති පුහුණු පාඨමාලා පැවැත්වීම හා පාඨමාලාව අවසානයේ සහභාගිකයන්ගේ නිර්මාණ ඇතුළත් චිත්‍ර හා මූර්ති ප්‍රදර්ශන පැවැත්වීම මෙන්ම ජාතික මට්ටමේ චිත්‍ර හා මූර්ති ප්‍රදර්ශන පැවැත්වීම සහ භාෂා අධ්‍යයනය, භාෂා පරිචය, ජන මාධ්‍යය, ටෙලි නාට්‍යය, සාහිත්‍යය, සෞන්දර්යවේදය, විචාර න්‍යාය ආදියට අදාළ පාඨමාලා, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම සිදු කෙරේ.

**පර්යේෂණ ඒකකය** යටතේ, පර්යේෂණ ව්‍යාපෘති, ඓතිහාසික ස්ථාන හා පුරාවිද්‍යාත්මක ස්මාරක ගවේෂණ හා සංරක්ෂණ ව්‍යාපෘති, අන්තර් වාර්ගික සංස්කෘතික අධ්‍යයන හා ජනකලා, ජනශ්‍රැති පිළිබඳ පර්යේෂණ හා සංරක්ෂණ ව්‍යාපෘති සිදු කෙරේ. ජාතික වැදගත්කමකින් යුත් රුහුණු ප්‍රදේශයට විශේෂිත වූ සාහිත්‍ය, කලා, ජනශ්‍රැති, මානව විද්‍යා හා සමාජවිද්‍යා යන විෂය ක්ෂේත්‍රවලට අදාළ විවිධ ව්‍යාපෘති යෝජනා සකස් කොට ක්‍රියාත්මක කිරීම මෙම ඒකකය හරහා සිදු කෙරේ. ඒ අනුව, ඓතිහාසික ස්ථාන හා පුරාවිද්‍යාත්මක ස්මාරක ගවේෂණ හා සංරක්ෂණ ව්‍යාපෘති යටතේ රුහුණු ප්‍රදේශයට අයත් ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක ස්ථාන සහ ස්මාරක පිළිබඳ ගවේෂණ, පර්යේෂණ කිරීම සහ සංරක්ෂණ කටයුතු සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට වාර්තා ඉදිරිපත් කිරීම සිදු කෙරෙන අතර අන්තර් වාර්ගික සංස්කෘතික අධ්‍යයන හරහා විවිධ ජන වර්ගවලට එනම්, සිංහල, දෙමළ, මුස්ලිම් සහ මැලේ යන ජනවර්ගවලට අයත් ආවේණික සංස්කෘතිකාංග හඳුනා ගැනීම, සංරක්ෂණය, හුවමාරුව සහ ප්‍රවර්ධනය කිරීම සඳහා දායක වේ. එසේම, ජනකලා, ජනශ්‍රැති පිළිබඳ පර්යේෂණ හා සංරක්ෂණ ව්‍යාපෘති යටතේ, කෝලම්, වෙස් මුහුණු, රූකඩ, ජන නැටුම්, ජන ගායනා, ජන සංගීත වැනි පාරම්පරික කලා නිර්මාණ ශිල්පී පරම්පරා, පාරම්පරික කලා තාක්ෂණය වැනි ක්ෂේත්‍ර පිළිබඳ ගවේෂණය සහ පර්යේෂණ පැවැත්වීම, පිටපත් කිරීම්, පටිගත කිරීම්, වීඩියෝ පටිගත කිරීම් වැනි ක්‍රමවලින් ජන කලා සංරක්ෂණය කිරීම, ජනශ්‍රැති අධ්‍යයනය හා සංරක්ෂණ ව්‍යාපෘති සිදු කිරීම හා ජන සාහිත්‍ය, ජන වෙදකම, ජන තාක්ෂණය, ජන සූපවේදය වැනි අංශ පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සහ මුද්‍රණය, පටිගත කිරීම හා සූක්ෂම ඡායාරූපගත කිරීම වැනි ක්‍රම මඟින් සංරක්ෂණය කිරීම සිදු කෙරේ.

## නිලධාරී මණ්ඩලය



**ආචාර්ය ඒ. එම්.ඒ. එස්. ගුණසේකර**
**සම්බන්ධීකාරක**
**සංස්තික කේන්ද්‍රය**

ආචාර්ය සුරංජිත් ගුණසේකර මහතා රුහුණ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික කේන්ද්‍රයේ සම්බන්ධීකාරක වශයෙන් කටයුතු කරන අතර ඔහු සමාජවිද්‍යා අධ්‍යනාංශයේ ජ්‍යෝෂ්ඨ කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කරයි. එසේම මෙතුමා පර්යේෂකයෙකු ලෙස බොහෝ පර්යේෂණ සඳහා දායක වී ඇති අතර, පර්යේෂණවලින් ලබාගත් ශාස්ත්‍රීය දැනුම අන් අය සමඟ නොමසුරුව බෙදාගෙන ඇත. මෙතුමා, ජනවාර්ගික සබඳතා, ගැටුම් හා සාමය පිළිබඳවද, සංහිඳියාව, ආපදා කළමනාකරණය පාරිසරික සමාජ විද්‍යාව හා ස්ත්‍රී/පුරුෂ සමාජ භාවයන් ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක හසළ අත්දැකීම් සහිත පුද්ගලයෙකි. ප්‍රජාපාදක පර්යේෂණ ගණනාවක පර්යේෂකයෙකු ලෙස කටයුතු කර ඇති මොහු සමාජ අන්තර්කරණයෙහිලා කටයුතු කරන ක්‍රියාකාරී සාමාජිකයෙකි. සංස්කෘතික කේන්ද්‍රයේ වත්මන් සම්බන්ධීකාරක වශයෙන් කලාව, ජීවිතය සහ සංස්කෘතික උරුමයන් ආරක්ෂණයේ හා ප්‍රවර්ධනයේ ප්‍රශස්ත භූමිකාවක් මොහු විසින් ඉටු කරනු ලබයි.



**ප්‍රදීප් නානායක්කාර**
**ස්ථානභාර නිළධාරීතුමා**
**සංස්තික කේන්ද්‍රය**

ප්‍රදීප් නානායක්කාර මහතා සංස්කෘතික කේන්ද්‍රයේ ස්ථානභාර නිළධාරී වශයෙන් කටයුතු කරන අතර සංස්කෘතික කේන්ද්‍රයේ ගොඩනැගිලි ඇතුළු සෑම දෙයකම භාරකාරීත්වය දරයි. සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛවලට අනුව කුසලතා සංවර්ධන වැඩසටහන් පවත්වාගෙන යාම හා සම්පත්දායකයින් බඳවා ගැනීම මෙතුමාගේ වගකීම වන අතර කේන්ද්‍රයේ ආයතනික පරිපාලන කටයුතු හා මූල්‍ය කටයුතු ගබඩාව හා මධ්‍යස්ථානය සතු සියලු බඩු බාහිරාදිය පිළිබඳ සම්පූර්ණ වගකීම දරයි. එසේම සංස්කෘතික මධ්‍යස්ථානය තුළින් ඉටු විය යුතු කාර්යයන් සංස්කෘතික අමාත්‍යාංශය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගතයුතු අතර අවශ්‍ය සෑම ආවස්ථාවකම සෑම කෙනෙකුගේම පරමාර්ථ ඉටුවන ආකාරයට කටයුතු කරමින් පවතියි.



**එන්. එච්. ටී. අනුරුද්ධ**
**සංවර්ධන නිලධාරී**
**සංස්කෘතික කේන්ද්‍රය**

තරංග අනුරුද්ධ මහතා රුහුණ විශ්වවිද්‍යාලයේ ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යනාංශයේ ඉගෙනුම ලබමින් තාවකාලික සහකාර කථිකාචාර්යවරයෙකු වශයෙන් 2018 ත් 2020 ත් අතර කාලය තුළ සේවයේ නියුක්තව සිට ඇත. ඔහු විසින් තම විද්‍යාපති උපාධිය කැළණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ලබාගෙන ඇත. ඔහු මේ වන විට People's lk ආයතනයේ ප්‍රධාන විධායක නිළධාරී වශයෙන්ද රුහුණ විශ්වවිද්‍යාලයේ සංස්කෘතික කේන්ද්‍රයේ හා ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයේද විද්‍යාර්ථීන් උදෙසා බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස සේවයේ නිරත වේ. සමාජ පර්යේෂකයෙකු ලෙස හා ඡායාරූපකරණය පිළිබඳ ක්ෂේත්‍රය පර්යේෂණ කටයුතු හා ඡායාරූපකරණ කටයුතු සිදු කරයි.



**එම්.ආර්.එෆ්. රිෆ්කා**
**සීමාවාසික පුහුණු නිළධාරිණී**
**සංස්කෘතික කේන්ද්‍රය**

එම්. ආර්.එෆ්. රිෆ්කා මෙනෙවිය රුහුණ විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ සිව්වන වසරේ ශිෂ්‍යයාවක් වන අතර ඇය රුහුණ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික කේන්ද්‍රයේ සීමාවාසික පුහුණු නිළධාරිණියක ලෙස 2024 වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේ සිට සිය සේවය ආරම්භ කරන ලද අතර සංස්කෘතික කේන්ද්‍රයේ සියලුම වැඩකටයුතුවලදී තම සක්‍රීය දායකත්වය ලබා දෙන ලදි.

# සංස්කෘතික කේන්ද්‍රයේ හිටපු සම්බන්ධීකාරකවරුන්



විශ්‍රාමික මහාචාර්ය ජයන්ත අමරසිංහ
සිංහල අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය



මහාචාර්ය දේව මයිකල්ද සිල්වා
ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය



හිටපු මහාචාර්ය විලේගොඩ අරියදේව හිමි
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය



ආචාර්ය දර්ශන මනෝජ් බණ්ඩාර
(වැඩබලන සම්බන්ධීකාරක)
ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය



ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය ශාන්තසිරි අබේවර්ණ
රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය



ආචාර්ය සුරංජිත් ගුණසේකර (වර්තමාන)
සමාජවිද්‍යා අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය



විශ්‍රාමික මහාචාර්ය ධර්මා රාජපක්ෂ
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය

# සංස්කෘතික කේන්ද්‍රයේ වර්තමාන උපදේශක මණ්ඩලය



ආචාර්ය අපරැක්කේ සිරිසුධම්ම හිමි
සිංහල අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය



මහාචාර්ය තුෂාර චමින්ද
සිවිල් හා පාරිසරික ඉංජිනේරු අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය



ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
එම්.එස්.එම්.එල්. කරුණාරත්න
භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය



ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චම්පිකා එල්ලාවල
සිවිල් හා පාරිසරික ඉංජිනේරු අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය



කථිකාචාර්ය අයි.ආර්.එන්.එස්. පීරිස්
සිංහල අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය



ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඩබ්.ජී.එන්.ඩී. විජේසිංහ
ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය



කථිකාචාර්ය කේ. කන්දෙවත්ත
ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය



කථිකාචාර්ය එන්.ඩබ්.එස්. නානායක්කාර
භූගෝල විද්‍යා අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය

# සංස්කෘතික කේන්ද්‍රය මඟින් පවත්වනු ලබන පාඨමාලා







රුහුණ විශ්වවිද්‍යාලයේ සංස්කෘතික කේන්ද්‍රය හා සංස්කෘතික අමාත්‍යාංශය ඒකාබද්ධව රුහුණ විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන්ගේ කුසලතා වර්ධනයට හා ඔවුන්ගේ වෘත්තීයමය දිවියට අත්වැලක් වනු පිණිස පහත සඳහන් පාඨමාලා සංස්කෘතික කේන්ද්‍රයේ පවත්වන ලදි.

- උඩරට නර්ථනය
- පහතරට නර්තනය
- ඡායාරූපකරණය
- චිත්‍ර හා මූර්ති
- නාට්‍ය හා රංගකලාව

උඩරට නර්තනය පාඨමාලාව සඳහා දිනුක සඳරුවන් මහතාද, නාට්‍ය හා රංගකලාව පාඨමාලාව සඳහා තාරක පුෂ්පකුමාර මහතාද, ඡායාරූපකරණය පාඨමාලාව සඳහා සංජු උෂාන් රංගොඩගේ මහතාද, චිත්‍ර පාඨමාලාව සඳහා වජිර බොරලැස්ස මහතාද සහ සංගීතය පාඨමාලාව සඳහා ඩඩ්ලි එස්. ජයවර්ධන මහතාද සම්පත්දායකයින් ලෙස කටයුතු කරන ලදි.

රුහුණ විශ්වවිද්‍යාලයේ සංස්කෘතික කේන්ද්‍රය සහ people.lk සමග ප්‍රතිභා මාධ්‍ය ජාලය එක්ව රුහුණ විශ්වවිද්‍යාලයීය මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ මාධ්‍ය පාඨමාලාව හැදෑරූ ශිෂ්‍යයන්ගේ මාධ්‍ය පෙරහුරු වැඩසටහන 2024 වර්ෂයේ ජනවාරි 06 වන දින පවත්වන ලදි.

## මාධ්‍ය පෙරහුරු වැඩසටහන









# නව පාඨමාලා ආරම්භ කිරීම

රුහුණ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික කේන්ද්‍රය මඟින් විද්‍යාර්ථීන්ගේ දක්ෂතා ඔප් නැංවීම උදෙසා විවිධ වූ පාඨමාලාවන් ආරම්භ කරන ලද අතර එම පාඨමාලාවන් හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලයේ සියලුම විද්‍යාර්ථීන් සඳහා අවස්ථා විවෘත කරන ලදි. ඒ අනුව සංස්කෘතික කේන්ද්‍රය මඟින් චිත්‍ර, උඩරට නර්තනය, පහතරට නර්ථනය, නාට්‍ය හා රංග කලාව, සංගීතය හා ඡායාරූපකරණය යන පාඨමාලාවන් ආරම්භ කරන ලදී.



සංස්කෘතික කේන්ද්‍රය මඟින් පවත්වනු ලබන චිත්‍ර පාඨමාලාව යටතේ ව්‍යාපාර කටයුතු සඳහා චිත්‍ර ඇඳීමට විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථීන් පුහුණු කිරීම වජිර බොරලැස්ස මහතාගේ මූලිකත්වයෙන් 2024 වර්ෂයේ ජනවාරි 10 වන දින සිදු කරන ලද අතර 2024 වර්ෂයේ ජනවාරි මස 17 වන දින සංස්කෘතික කේන්ද්‍රයේ නව නර්තන පාඨමාලාවද ආරම්භ කරන ලදි.







## යාපනය හා රුහුණ විශ්වවිද්‍යාල මිත්‍රත්ව ක්‍රිකට් තරඟාවලිය සඳහා නර්තන අංග ලබා දීම

2024 වර්ෂයේ මාර්තු 30 වන දින රුහුණ විශ්වවිද්‍යාලයීය ක්‍රීඩාංගණයේදී, යාපනය විශ්වවිද්‍යාලය හා රුහුණ විශ්වවිද්‍යාලය අතර පවත්වන ලද මිත්‍රත්ව ක්‍රිකට් තරඟාවලිය සඳහා සංස්කෘතික කේන්ද්‍රය මඟින් නර්තන අංග හයක් ලබා දෙන ලදී. ජාතීන් අතර සමාජ සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම මෙම වැඩසටහනේ මුඛ්‍ය පරමාර්ථය විය. එහිදී සිංහල හා දෙමළ සංස්කෘතීන්හි අනන්‍යතාවයන් නිරූපණය කිරීම සඳහා මෙන්ම සමාජය තුළ සහජීවනය ප්‍රවර්ධනය කිරීම උදෙසා ශිෂ්‍යය නැඹුරුව වැඩි දියුණු කිරීම අරමුණු කොට ගනිමින් සිංහල හා දෙමළ සාම්ප්‍රදායික නර්තනයන් ඉදිරිපත් කෙරිණි.



# අවුරුදු නැකැත් සීට්ටු ලබා දීම

2024 වර්ෂයේ අප්‍රේල් මස 08 වන දින සංස්කෘතික කේන්ද්‍රයේ මූලිකත්වයෙන් රුහුණ විශ්වවිද්‍යාලයීය ප්‍රධාන ශ්‍රවනාගාරය වන රබීන්ද්‍රනාත් තාගෝර් ශ්‍රවනාගාරයේදී හිටපු උපකුලපතිතුමා වන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතා හට සහ හිටපු නියෝජ්‍ය උපකුලපතිතුමා වන ආචාර්ය සමන් චන්දන මහතාට මෙන්ම අධ්‍යයනාංශ ප්‍රධානීන් වෙත නැකැත් සීට්ටු ලබා දීම සිදු කරන ලදී.







## "රාමුව" සහ "සෙවනැලි" නාට්‍යයන් ප්‍රදර්ශනය කිරීම

රුහුණ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික කේන්ද්‍රය මගින් අන්තර් සංස්කෘතික ප්‍රතිභා කෙටි නාට්‍ය තරග ඉසව්ව සඳහා සහභාගීව ජයග්‍රහණයන් ලබා ගන්නා ලද "රාමුව" සහ "සෙවනැලි" යන නාට්‍යයන් රුහුණ විශ්වවිද්‍යාලයීය ප්‍රජාව උදෙසා ප්‍රදර්ශනය කිරීම 2024 වර්ෂයේ අගෝස්තු මස 07 වන දින පෙ.ව.10.00 ට රුහුණ විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපතිතුමන් වන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මැතිතුමාගේ මෙන්ම හිටපු නියෝජ්‍ය උපකුලපතිතුමන් වන ආචාර්ය සමන් චන්දන මහතාගේ ප්‍රධානත්වයෙන් හා සංස්කෘතික කේන්ද්‍රයේ සම්බන්ධීකාරකතුමන් වන ආචාර්ය සුරන්ජිත් ගුණසේකර මහතාගේ මඟ පෙන්වීම යටතේ රුහුණ විශ්වවිද්‍යාලයීය මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨ ශ්‍රවනාගාරයේදී පැවැත්විණි.







සෙවනැලි













# 2025 වර්ෂය සඳහා සම්පත්දායකයින් බඳවා ගැනීම




රුහුණ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික කේන්ද්‍රය මගින් 2025 වර්ෂයේ ආරම්භ කිරීමට නියමිත උඩරට නර්තනය, නව නිර්මාණ හා ජන නැටුම්, පෙරදිග සංගීතය, ජන සංගීතය, චිත්‍ර හා මූර්ති කලාව, නාට්‍ය හා රංග කලාව සහ ඡායාරූපකරණය යන පාඨමාලා සඳහා නව සම්පත්දායකයින් බඳවා ගැනීමට 2025 වර්ෂයේ ඔක්තෝම්බර් මස 25 වන දින සම්පත්දායකයින් ලියාපදිංචි කරගැනීම උදෙසා සංස්කෘතික කේන්ද්‍රයේ නිල ෆේස්බුක් පිටුවේ දැන්වීම් එළ කරන ලදි.

# කලාව සහ ජීවිතය

සංස්කෘතික කේන්ද්‍රය මගින් කලාකාමී හදවත් වෙනුවෙන් 2025 වර්ෂයේ ජනවාරි මස 08 වන දින සවස 4.00 ට වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ දේශන ශාලාවේදී විශ්‍රාමික මහාචාර්ය ජයන්ත අමරසිංහ මහතා විසින් "කලාව සහ ජීවිතය" මැයෙන් දේශනයක් පැවැත්වීම සඳහා කටයුතු සූදානම් කරන ලද අතර සංස්කෘතික කේන්ද්‍රයේ නිල ෆේස්බුක් පිටුවේ ඒ සඳහා වන දැන්වීම් එළ කරන ලදි.




රුහුණ විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් හා ආදි විද්‍යාර්ථීන් විසින් රචිත ගීත සහ ගායනයන් පිළිබඳ විචාරාත්මක හා සෞන්දර්යාත්මක වැඩසටහන් සිදු කරන ලද අතර එහිදී එම ගීත ප්‍රචාරණය සඳහා සටයුතු කරන ලදී. එසේම, වැඩසටහන සඳහා පැමිණි සියලුම ප්‍රේක්ෂකයන් උදෙසා එම ගීත රස විඳීම සඳහා අවස්ථාව උදා කර දෙනු ලැබූ අතර වැඩසටහන සඳහා පැමිණ සිටි ප්‍රේක්ෂකයන් සඳහා ඔවුන්ගේ අදහස් ලබා දීමටද අවකාශය ලබා දෙන ලදි. එමෙන්ම ජයන්ත අමරසිංහ මහතා විසින් ගීත විචාරය අතර තුර සහෘද ප්‍රේක්ෂක ප්‍රජාවගේ රසවින්දනය සඳහා කලාවේ දායකත්වය මෙන්ම ජීවිතයට කලාව බද්ධ කර ගැනීම තුළින් ජීවිතය රසවත් කරගැනීම පිළිබඳව රසබර සාකච්ඡාවන් සිදු කරන ලදී.







# ජයග්‍රහණ ලැබූ විද්‍යාර්ථීන් ඇගයීම













2024 වර්ෂයේ අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රතිභා සංගීත, නර්තන හා චිත්‍ර තරග සඳහා රුහුණ විශවිද්‍යාලයීය සංස්කෘතික කේන්ද්‍රයේ පාඨමාලාවන් හදාරන විද්‍යාර්ථීන් ඉදිරිපත් වෙමින් දකුණු පළාත් වටයෙන් නව නිර්මාණ, සමූහ/මිශ්‍ර විවෘත නර්තන තරග ශීර්ෂයෙන් ප්‍රථමස්ථානයත්, "හෙට දවස" තේමා කරගනිමින් නව නිර්මාණ - වාදන/සංගීත තරග ශීර්ෂයෙන් ප්‍රථමස්ථානයත්, චිත්‍ර විවෘත අංශයෙන් ප්‍රථම හා දෙවන ස්ථානයත් ලබා ගැනීමට සමත් වූහ. අනතුරුව සමස්ත ලංකා තරග නියෝජනය කළ නව නිර්මාණ - සමූහ/මිශ්‍ර විවෘත නර්තන තරග ඉසව්වෙන් ජාතික වටයේ ප්‍රථමස්ථානයත් "හෙට දවස" තේමාකරගත් විවෘත - සමූහ/මිශ්‍ර සංගීත තරග ඉසව්වෙන් තෙවන ස්ථානයත් හිමි කරගැනීමට සමත්විය.

මෙම සියලු කටයුතු වෙනුවෙන් සහය දැක්වූ රුහුණ විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතාට, සංස්කෘතික කේන්ද්‍රයේ සම්බන්ධීකාරක, ආචාර්ය සුරන්ජිත් ගුණසේකර මහතාට මෙන්ම සියළු කටයුතු වෙනුවෙන් කැප වූ නර්තනය පාඨමාලාවේ සම්පත්දායක දිනුක සදරුවන් මහතාට, චිත්‍ර හා මූර්ති පාඨමාලාවේ සම්පත්දායක, වජිර ඉන්දික බොරලැස්ස මහතාට, සංගීත අංශය වෙනුවෙන් ප්‍රවීන් අමරතුංග විද්‍යාර්ථයාට, සංස්කෘතික කේන්ද්‍රයේ හිටපු ස්ථානභාර නිලධාරිනී, නිලන්ති රේණුකා මහත්මිය ඇතුළු සංස්කෘතික කේන්ද්‍රයේ කාර්යය මණ්ඩලයට හා විද්‍යාර්ථීන් සියළු දෙනාට එම ජයග්‍රහණයන්හි ගෞරවය හිමි වේ. මෙසේ ජයග්‍රහණය ලැබූ විද්‍යාර්ථීන් ඇගයීම වෙනුවෙන් 2024 වර්ෂයේ දෙසැම්බර් මස 16 වන දින ප.ව. 4.00ට මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ ශ්‍රවණාගාරයේදී මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ පීඨාධිපතිතුමන් වන ප්‍රියන්ත රේණුක මහතාගේ හා සංස්කෘතික කේන්ද්‍රයේ සම්බන්ධීකාරකතුමන් වන ආචාර්ය සුරන්ජිත් ගුණසේකර මහතාගේ ප්‍රධානත්වයෙන් ඇගයුම් උළෙලක් සංවිධානය කරන ලදී.










## අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන කෙටි නාට්‍ය තරඟාවලිය 2023

2023 වර්ෂයේ අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන කෙටි නාට්‍ය තරගාවලියේ ජාතික වටය සඳහා ඉදිරිපත් වූ රුහුණ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික කේන්ද්‍රයේ නාට්‍ය හා රංග කලාව හදාරන විද්‍යාර්ථීන්, 2023 වර්ෂයේ ජනවාරි මස 23 වන දින එල්පින්ස්ටන් රංග ශාලාවේ දී පැවති සම්මාන හා සහතික ප්‍රදානෝත්සවය සඳහා සහභාගී වී “රාමුව” කෙටි නාට්‍යය සඳහා කුසලතා සම්මාන මෙන්ම සහතික හා මුදල් ත්‍යාග තුනක් ද, “සෙවණැලි” නාට්‍යයේ හොඳම සහාය නිලිය, හොඳම රංග වින්‍යාසය හා හොඳම අධ්‍යක්ෂණයට සම්මාන සහතික හා මුදල් ත්‍යාග ද, ජාතික වටයේ හොඳම නාට්‍ය පහ අතරින් “සෙවනැලි” නාට්‍ය තෙවන ස්ථානයද ලෙසින් විශිෂ්ට ජයග්‍රහණයන් අත්පත් කරගන්නා ලදී. මේ සඳහා විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතා, නියෝජ්‍ය උපකුලපති, ආචාර්ය සමන් චන්දන මහතා සහ සංස්කෘතික කේන්ද්‍රයේ සම්බන්ධීකාරක ආචාර්ය සුරන්ජිත් ගුණසේකර මහතා උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දුන් අතර මේ සඳහා ඉතා වෙහෙස වී පුහුණුවීම් කටයුතු සිදු කළ විද්‍යාර්ථීන් දිරි ගන්වමින් පුහුණුවීම් සිදු කළ නාට්‍ය හා රංග කලා පාඨමාලාවේ සම්පත් දායකත්වය ලබා දුන් නාට්‍ය ශිල්පී තාරක පුෂ්පකුමාර මහතා හට විශේෂ ගෞරවය හිමි විය, සංස්කෘතික කේන්ද්‍රය නියෝජනය කරමින් නාට්‍ය සඳහා ඉදිරිපත් වූ විද්‍යාර්ථීන් හට මෙම ජයග්‍රහණය ඉතා ගෞරවණීය වනු ඇත.






# ප්‍රතිභා අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන තරඟාවලිය
# 2024



බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මගින් 2024 වර්ෂයේ සැප්තැම්බර් මස 29 වන දින පවත්වන ලද 2024 ප්‍රතිභා අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන තරගාවලියේ දකුණු පලාත් වටය නියෝජනය කරමින් රුහුණු විශ්වවිද්‍යාලයීය සංස්කෘතික කේන්ද්‍රයේ නර්ථන පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන් සහභාගී වූ අතර දේශීය විදේශීය සාම්ප්‍රදායික නර්තන ඇසුරින් (සමුහ/මිශ්‍ර) නිර්මාණාත්මක නර්තන අංශය යටතේ ප්‍රථමස්ථානය දිනාගත් අතර "හෙට දවස" යන තේමාව මුල්කොට ගත් සමුහ වාදන තරග අංශය යටතේ ප්‍රථමස්ථානය ද හිමි කර ගැනීමට සංගීත පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන් පිරිස සමත් විය.

මෙම තරග අංශ සදහා මානව ශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය, කළමණාකරණ හා මූල්‍ය පීඨය, විද්‍යා පීඨය හා සාගර විද්‍යා පීඨය යන පීඨවල, සංස්කෘතික කේන්ද්‍රයේ පාඨමාලා හදාරන විද්‍යාර්ථීන් සහභාගී වූහ. නර්තන පාඨමාලාවේ සම්පත්දායක දිනුක සඳරුවන් මහතා සහ සංගීතය පාඨමාලාවේ සම්පත්දායක ප්‍රවීන් අමරතුංග විද්‍යාර්ථයා ඇතුලු සංස්කෘතික මධ්‍යස්ථානයේ නිළධාරීන්ගේ කැපවීම මෙම ජයග්‍රහණයට මුලික විය. මෙම තරගාවලිය සදහා අවශ්‍ය උපදෙස් සහ මග පෙන්වීම් සිදු කළ රුහුණ විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතා, හිටපු නියෝජ්‍ය උපකුලපති සමන් චන්දන මහතා සහ සංස්කෘතික කේන්ද්‍රයේ සම්බන්ධිකාරක සුරන්ජිත් ගුණසේකර මහතාට විශේෂ ගෞරවය හිමි විය.

# අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රතිභා චිත්‍ර තරගාවලිය

2024 වර්ෂයේ අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රතිභා චිත්‍ර තරගාවලියේ දකුණු පලාත් වටය නියෝජනය කරමින් රුහුණ විශ්ව විද්‍යාලීය සංස්කෘතික කේන්ද්‍රයේ චිත්‍ර හා මූර්ති පාඨමාලාව හදාරන විද්‍යාර්ථීන් සහභාගී වු අතර , ඉන් ප්‍රථම ස්ථානයත්, තුන්වන ස්ථානයත් සහ කුසලතා ස්ථාන තුනකුත් හිමි කර ගැනීමට එම විද්‍යාර්ථීන් සමත් වූ අතර වජීර ඉන්දික බොරලැස්ස ගුරුතුමන්ගේ සම්පත්දායකත්වය සහ මග පෙන්වීම මත එය සිදුවිය.



